# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 34 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 සැප්තැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 34 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 අගෝස්තු මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 78/74.

**වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 34 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් හඳුන්වනු ලබන 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනතේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 1959 අංක 23 දරන පනතේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම්.

4. (1) මෙහි පහත සඳහන් තැනැත්තෝ, 15 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, ආයතනයේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුස්සෝ වන්නාහ :—

(i) මේ පනත යටතේ සභාව විසින් පැවැත්වීමට නියමිත, ආයතනයේ සාමාජිකත්වය සඳහා වූ යෝග්‍යතා පරීක්ෂණයකින් සමත් වී, සභාව විසින් අනුමත කරනු ලැබූ ප්‍රායෝගික පුහුණුවීමේ පරිපාටියක්, සභාව විසින් නියම කරනු ලැබිය හැකි කාල සීමාවක් තුළ සම්පූර්ණ කරන තැනැත්තෙක් :

එසේ වුව ද, එම ප්‍රායෝගික පුහුණුව, වෘත්තියෙහි යෙදී සිටින ගණකාධිකාරිවරයකු යටතේ සේවයට සීමා නොවිය යුතුය ;

(ii) කවර නමකින් හැඳින්වුන ද සභාවේ මතය අනුව ආයතනය හා සමාන තත්ත්වයක වූ සංගමයක් හැටියට, සභාව විසින් සාදන ලද නියෝගවලින් අනුමත කරනු ලැබූ, ගණකාධිකාරීන්ගේ යම් සමිතියක හෝ ආයතනයක සාමාජිකයකු වන තැනැත්තෙක් :

එසේ වුව ද, එවැනි යම් සමිතියක් හෝ ආයතනයක් හෝ එසේ අනුමත කරනු ලැබුව ද ඒ සමිතියේ හෝ ආයතනයේ

ඊ 15458—9,990 (75/07)

හෝ යම් පන්තියක නැතහොත් වර්ගයක සාමාජිකයන් ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුස්සන් නොවන බව සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය ; තවද

(iii) නියමිත දිනය වන විට, 1941 සමාගම් (විගණක) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබ සිටි තැනැත්තෙක්.

(2) වෘත්තියෙහි යෙදී සිටින ගණකාධිකාරිවරයකු යටතේ ප්‍රතිඥාත ලිපිකරුවකු වශයෙන් පුහුණුව ලැබීම නියමිත දිනයට හෝ අදාළ වන දිනයට හෝ පෙර ආරම්භ කොට නියෝග මගින් නියමිත කාල පරිච්ඡේදයක පුහුණුවක් ඉහත සඳහන් දිනවලට පෙර සම්පූර්ණ කළ හෝ එකී දිනවලට පසුව සම්පූර්ණ කරන්නා වූ හෝ තැනැත්තකු (1) වන උපවගන්තියේ (i) වන ඡේදයේ කාර්ය සඳහා නියමිත පුහුණුවීමේ කාලය සම්පූර්ණ කළ තැනැත්තකු ලෙස සැලකිය යුතු යයි ප්‍රකාශ කිරීම ප්‍රඥගෝචර යයි සභාව විසින් සලකනු ලබන්නේ නම්, එවැනි විධිවිධානයක්, එකී (i) වන ඡේදයේ කාර්ය සඳහා පුහුණුවීමේ කාල පරිච්ඡේදය නියම කිරීම සම්බන්ධයෙන් සභාව විසින් සාදනු ලබන යම් නියෝගයක අඩංගු කළ හැකිය.

(3) (1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ කාර්ය සඳහා යම් සමිතියක් හෝ ආයතනයක් හෝ අනුමත කිරීම් වශ සභාව විසින් නියෝග සෑදීමේ දී, එවැනි සමිතියක හෝ ආයතනයක හෝ සාමාජිකයකු සභාව විසින් අනුමත කරනු ලබන පුහුණුවක් සභාව විසින් නිශ්චය කරනු ලබන කාලයක් තුළ දී ලබා ගත හොත් මිස එවැනි සාමාජිකයකු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකත්වයට සුදුසු නොවන්නේය යන විධිවිධානය එකී අනුමතියේ කොන්දේසියක් වශයෙන් එකී නියෝගයෙහි ඇතුළත් කළ හැකිය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් :—

“ (2) ආයතනයේ යම් සාමාජිකයකු විසින්, නියමිත දිනයට පෙර හෝ පසුව හෝ එක් කාල පරිච්ඡේදයක් නියමිත දිනයට පෙර සහ අනෙක් කාල පරිච්ඡේදය

නියමිත දිනයට පසුව යන ආකාරයට හෝ, ගණකාධිකාරීවරයකු වශයෙන් දස වර්ෂයකට නොඅඩු අඛණ්ඩ වෘත්තීය පරිචයක් තමාට ඇති බවට නැතහොත් ආයතනයේ සාමාජිකයකු වශයෙන් තමා දස වර්ෂයක් සම්පූර්ණ කර ඇති බවට සභාව තෘප්තියට පැමිණ වුවහොත්, ආයතනයේ අධි සාමාජිකත්වය සඳහා 1985 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර ඔහු විසින් ඉල්ලුම් කරනු ලැබූ විට හා නියමිත ගාස්තුව ඔහු විසින් සභාව වෙත ගෙවනු ලැබූ විට, ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් සභාව විසින් ඔහු ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, ඉන්බිනි ඔහු එසේ අධි සාමාජිකයකු බව ඇඟවීම පිණිස "එෆ්.සී.ඒ." යන අකුරු තම නම අගට භාවිත කිරීමේ හිමිකම ඔහුට ලැබේ.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් ලියාපදිංචි කිරීමට සුදුසුකම් නොලත් ආයතනයේ යම් සාමාජිකයකු, සභාව විසින් පැවැත්වීමට නියමිත අධි සාමාජිකත්ව විභාගය සමත්වීමෙන් පසු නියමිත ගාස්තුව සභාව වෙත ගෙවා තත් කාර්යය සඳහා ඉල්ලා සිටි විට ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් සභාව විසින් ලියාපදිංචි කරනු ලැබීමට ඔහු සුදුසුකම් ලබන්නේ ය. ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් සභාව විසින් ඒ සාමාජිකයා එසේ ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු තමා එවැනි අධි සාමාජිකයකු බව ඇඟවීම සඳහා "එෆ්.සී.ඒ." යන අකුරු තම නම අගට භාවිත කිරීමේ හිමිකම ඔහුට ලැබේ.

(4) ආයතනයේ අධි සාමාජිකයකු වශයෙන් (2) වන උපවගන්තිය යටතේ හෝ (3) වන උපවගන්තිය යටතේ හෝ ලියාපදිංචි කරනු නොලැබූ ආයතනයේ සෑම සාමාජිකයකු ම ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වන අතර, ඔහු එසේ ආශ්‍රිත සාමාජිකයකු බව ඇඟවීමට "ඒ.සී.ඒ." යන අකුරු තම නම අගට භාවිත කිරීමේ හිමිකම ඔහුට ලැබේ." ; තවද

(2) එම වගන්තියේ (4) වන උපවගන්තිය එම වගන්තියේ (5) වන උපවගන්තිය වශයෙන් යළි අංක කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(2) පහත දැක්වෙන කාර්ය ඉටු කිරීම සභාවේ යුතුකම වේ :—

(අ) ආයතනයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබා ගැනීමේ විභාග පැවැත්වීම හෝ පැවැත්වීමට විධිවිධාන සැලැස්වීම සහ එම විභාග සඳහා අධ්‍යයන පාඨමාලා නියම කිරීම හෝ අනුමත කිරීම ;

(ආ) අදාළ වන දිනයේ දී හෝ ඒ දිනයට පෙර හෝ ගිවිසුම් කොන්දේසිවලට ඇතුළත් ව සිටින්නා වූ ප්‍රතිඥාත ලිපිකරුවන්ගේ ප්‍රතිඥාත ලිපිකාර නියුක්තිය, පුහුණුව හා මාරුකිරීම පිළිබඳ අධීක්ෂණය හා ඒවා විධිමත් කිරීම ;

(ඇ) ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීමත් එසේ ලියාපදිංචි කරනු ලැබූ ශිෂ්‍යයන්ට සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා ප්‍රායෝගික පුහුණුව පිළිබඳ පාඨමාලා සැපයීමත් අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම ;

(ඈ) අදාළ වන දිනයේදී හෝ ඊට පෙර හෝ ප්‍රතිඥාත ලිපිකරුවන් වශයෙන් ගිවිසුම් කොන්දේසිවලට ඇතුළත් ව සිටින්නා වූ ප්‍රතිඥාත ලිපිකරුවන් පුහුණු කිරීමට අයිතිය තිබෙන තැනැත්තන් කුමන පන්තියට අයත් තැනැත්තන් විය යුතු ද යන්න නිශ්චය කිරීම සහ එම පන්තියට අයත් යම් තැනැත්තකුට එම අයිතිය අහිමි වන්නේ කවර අවස්ථාවල දී ද යන්න නිශ්චය කිරීම ;

(ඉ) අදාළ වන දිනයේදී හෝ ඊට පෙර හෝ ප්‍රතිඥාත ලිපිකරුවන් වශයෙන් ගිවිසුම් කොන්දේසිවලට ඇතුළත් ව සිටින ප්‍රතිඥාත ලිපිකරුවන්ගෙන් අය කළ හැකි වාරිකවල හෝ ගාස්තුවල උපරිම ප්‍රමාණය කවරේද යන්න හා එම ගාස්තු අය කළ යුත්තේ කුමන කොන්දේසිවලට යටත්ව ද යන්න නියම කිරීම ;

(ඊ) ආයතනයේ සාමාජිකයන්ගේ නාම ලේඛනයක් පවත්වා ගෙන යාම සහ එය ප්‍රසිද්ධ කිරීම සහ වරලත් ගණකාධිකාරීන් මෙන් ශ්‍රී ලංකාවෙහි වෘත්තියේ යෙදීමට බලය ලත් තැනැත්තන්ගේ නාම ලේඛනයක් පවත්වා ගෙන යාම සහ එය ප්‍රසිද්ධ කිරීම ;

(උ) ආයතනයේ සාමාජිකයන් විසින් තම වෘත්තියේ තත්ත්වය රැක ගැනීම සුරක්ෂිත කිරීම සහ එම තත්ත්වය රැක ගැනීම සඳහා අවශ්‍ය වන ක්‍රම සහ පරිචයන් සාමාජිකයන්ට හඳුන්වා දීම සඳහා පියවර ගැනීම ;

(ඌ) ගණකාධිකරණයට අදාළ පොත්පත් සහ සඟරා රැස් කර තැබීම සඳහා පුස්තකාලයක් පවත්වා ගෙන යාම සහ එවැනි පොත් ශ්‍රී ලංකාවේ පළ කිරීමට ධෛර්ය දීම ;

(එ) ගණකාධිකරණය, විගණනය සහ වෙනත් ඒ හා සම්බන්ධ විෂයයන් පිළිබඳ ව පර්යේෂණ පැවැත්වීම හා එවැනි පර්යේෂණවලට ධෛර්ය දීම, ලියාපදිංචි

ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා උන්නතිය පොදු වශයෙන් නංවාලීම සහ ගණකාධිකාරින්ගේ වෘත්තීය ශුභ සිද්ධිය හා උන්නතිය සුරක්ෂිත කිරීම;

(ඒ) ලියාපදිංචි ශිෂ්‍යයන් විසින් අනුගමනය කළ යුතු ප්‍රායෝගික පාඨමාලාව අනුමත කිරීම; සහ

(ඔ) ගණකාධිකරණය සහ විගණනය ශිෂ්‍යයන්ට පුහුණු කිරීම සඳහා සැපයිය හැකි පහසුකම් පිළිබඳ තොරතුරු සභාව වෙත සපයන ලෙස යම් ආයතනයකට නියම කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"එසේ වුව ද, වෘත්තියේ යෙදීම සඳහා එවැනි සහතිකයක් ආයතනයේ සාමාජිකයකුට නිකුත් කිරීමේ දී, සභාව විසින් නියම කර ඇති සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයකින් ඒ තැනැත්තා සමත් වීමෙන් පසු වෘත්තියේ යෙදී සිටින ගණකාධිකාරින්ගේ ව්‍යාපාරික ආයතනයක යටත් පිරිසෙයින් දෙවර්ෂයක ප්‍රායෝගික පුහුණුවක් ඔහු විසින් ලබා ගෙන තිබේ නම් මිස, එවැනි සහතිකයක් ආයතනයේ සාමාජිකයකු වෙත නිකුත් නොකළ යුතුය.".

"ලංකා" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකා" යන වචන ආදේශ කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ "ලංකා" යන වචනය කවර තැනක යෙදී තිබුණ ද ඒ සෑම ස්ථානයක ම ඒ වෙනුවට "ශ්‍රී ලංකා" යන වචන ආදේශ කරනු ලැබිය යුතුය.

අර්ථ නිරූපණය.

7. මේ පනතෙහි, "අදාළ වන දිනය" යන්නෙන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය අදහස් වේ.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 80 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද, පනත් කෙටුම්පත් සහ නීති නොලැබීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.